**ඌවපරණගම ප්‍රාදේශීය සභාව**

**බදුල්ල දිස්ත්‍රික්කය**

---------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

----------------

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

---------------------------------

2016 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 20 දිනද, ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 28 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි. 2016 වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 ජූලි 31 දින සභාවේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

--------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ඌවපරණගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

----------------------------------------

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

------------------------

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේ දී නිරීක්ෂණය විය.

(අ) බැකෝ යන්ත්‍රයේ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල රු. 954,179 කින් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ආ) මෝටර් රථ හා කරත්ත ගිණුම රු. 4,394,000 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඇ) රු.104,990 ක් වටිනා අත් ට්‍රැක්ටරය ගිණුම්ගත වී තිබුණද එවැනි වාහනයක් භෞතික සත්‍යාපනයේදී නොතිබුණි.

(ඈ) රු.1,400,000 ක් වටිනා කැබ් රථය ගිණුම්වල ඇතුලත් කර නොතිබුණි.

(ඉ) රු. 312,282 ක්වූ අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂයක් ගිණුම්වල දක්වා තිබුණි.

(ඊ) අවසන් තොගය රු.5,293,786 ක් වැඩියෙන් දක්වා තිබුණි. ආරම්භක කුට්ටි ගල් තොගය රු. 232,168 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(උ) රු. 9,281,250 ක් ගෙවා මිලදී ගත් ඉඩමේ වටිනාකම ප්‍රාග්ධණීත කර නොතිබුණි.

(ඌ) ස්ථාවර තැන්පතු පොලී ආදායම රු.52,609 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයේ පළාත් පාලන විශ්‍රාම වැටුප් දායකය ලෙස රු.30,570 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂයේ උසාවි දඩ ලෙස රු.1,800,000 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඔ) සමාලෝචිත වර්ෂයේ හිඟහිටි උසාවි දඩ රු.1,664,393 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඕ) සමාලෝචිත වර්ෂයේ මුද්දර ගාස්තු ආදායම් රු.797,958 ක් වැඩියෙන් දක්වා තිබුණි.

1.3.2 **නොසැසඳූ පාලන ගිණුම්**

සභාව විසින් ඉදිරිපත් කර තිබූ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂයන් හා අදාල උපයෝගී ලේඛන සමඟ සැසඳීමේ දී වටිනාකම රු. 34,961,413 ක වෙනසක් නිරූපනය වී තිබුණි.

1.3.3 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.23,237,108ක් වූ අතර, එදිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ වල වටිනාකම රු. 15,768,602 ක් විය.

1.3.4 **නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව රු.374,772 ක් වටිනා අත්තිකාරම් ප්‍රමාණයක් 2016 දෙසැම්බර් 31 දින වන විටත් පියවා නොතිබුණි.

2. **මූල්‍ය සමාලෝචනය**

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.8,889,001 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.10,882,900 ක් විය.

2.2 **ආදායම් පරිපාලනය**

2.2.1 **ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

(අ) 2016 දෙසැම්බර් 31 දිනට ඉකුත් වර්ෂයට අදාලව ලැබිය යුතු හිඟ හිටි ආදායම රු. 2,133,645 ක් විය.

(ආ) 2012 වර්ෂයේ සිට සභාව විසින් පවතින ආදායම් වැඩිකර ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

2.2.2 **බදු කුලී**

බදුකුලී ලෙස 2005/2006 වර්ෂ වලදී අයකර ගන්නා ලද රු.124,000 ක් තැන්පත් ගිණුම්වල රඳවා තිබුණි.

2.2.3 **වෙනත් ආදායම්**

බැකෝ යන්ත්‍රය පෞද්ගලික පරිහරණය සඳහා ලබාදීමෙන් අයවිය යුතු රු.131,000 ක් අයකර ගෙන නොතිබුණි.

2.2.4 **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

පළාත් සභාවෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2016 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ හා මුද්දර ගාස්තු ප්‍රමාණය රු.10,929,014 ක් විය.

3. **මෙහෙයුම් සමාලෝචනය**

**කොන්ත්‍රාත් පරිපාලනය**

**ඌවපරණගම ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම**

ඌවපරණගම ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල ඉදිකිරීම සම්බන්ධව පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) මෙම ඉදිකිරීම් සම්බන්ධව ටෙන්ඩර් කිරීම, ඇස්තමේන්තු සකස් කිරීම, බිල්පත් ගෙවීම හා වැඩ වටිනාකම් ගණනය කිරීම කර නොතිබුණි.

(ආ) රු.7,424,009 ක ඉදිකිරීම් සම්බන්ධයෙන් ටෙන්ඩර් කැඳවා නොතිබුණි.

(ඇ) ඉදිකිරීම් සඳහා ගෙවන ලද රු.2,330,656 ක් වූ වටිනාකම සම්බන්ධව ගණනය කිරීමේ බිල්පත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ගොඩනැගිල්ලේ වැඩ කටයුතු අවසන් කර නොතිබුණි.

**4. යහපාලනය හා ගිණුම් කටයුතු භාවය**

**4.1 අයවැය පාලනය**

සමාලෝචිත වර්ෂයේදී අයවැය ලේඛනය ආදායම් හා වියදම් පාලනයේදී පාලන උපකරණයක් ලෙස භාවිතා කර නොතිබුණි.

**4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

ප්‍රවර්තන වර්ෂයේ වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් ක්‍රියාත්මක කර නොතිබුණි.

**4.3 අභ්‍යන්තර විගණනය**

2016 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

**4.4 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම**

ප්‍රවර්තන වර්ෂයේ විගණන කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කර නොතිබුණි.

**5 පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ස්ථාවර වත්කම්
(ආ) තොග පාලනය
(ඇ) ගිණුම්කරණය
(ඈ) කොන්ත්‍රාත් පරිපාලනය